*සැ. යු. -* මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2026 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,480 - 2026 මාර්තු මස 13 සිකුරාදා - 2026.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | | | පිටුව |
|---|---|---|---|
| තනතුරු අැබැර්තු | ... | ... | 370 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | ... | ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් | ... | ... | — |
| පළාත් පාලන නිවේදන | ... | ... | 373 |
| අතුරු ව්‍යවස්ථා | ... | ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | ... | ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන | ... | ... | — |
| අයවැය ලේඛන | ... | ... | — |
| දේපළ විකිණීම් | ... | ... | — |
| විවිධ දැන්වීම් | ... | ... | 375 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබැර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 02 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු 20 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


369 - B 082773 — (2026/03)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාවේ ඉඩම් දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත මිනින්දෝරු සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත මිනිනිදෝරු කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සේවාවෙහි නාමය සඳහන් කර **2026.03.27** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. මිලදී ගැනීමට නියමිත සේවාව : මහනුවර මහා නගර සභාවේ මිනින්දෝරු කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත බලය ලත් මිනින්දෝරු සේවය සපයා ගැනීම

2. මාසික දීමනාව : මාසික දීමනාව රු. 92,238 කි. (මසකට දින 21 ක් රාජකාරී ඉටු කිරීම සඳහා)

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

අධ්‍යාපන සුදුසුකම් : අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වද්‍යාලයකින්/ ආයතනයකින්

- I. මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ;
- II. විද්‍යාවේ දී විශේෂ උපාධියක් (ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ පරිගණක/ තොරතුරු තාක්ෂණ විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස) හෝ;
- III. ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක්; හෝ
- IV. පන්ති සාමාර්ථයක් සහිතව පරිගණක/තොරතුරු තාක්ෂණ විද්‍යාවේ දී උපාධියක්; හෝ
- V. පංති සාමර්ථයක් සහිතව ගණිතය හෝ භෞතික විද්‍යාව විෂයයන් සහිතව සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් තිබීම;

*හා*

ආ. අ.පො.ස. (උ.පෙළ) සඳහා ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් සමත් ව තිබීම.

වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරෙහි සේවය කරන, 2002 අංක 17 දරන මැනුම් පනත අනුව මැනුම් සභාවේ ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු පහත සඳහන් සුදුසුකම් සැපිරිය යුතුය.

- I මැනුම් විද්‍යා උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියෙකු නම්, මාස හය (06) ක දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් සමඟ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස යටත් පිරිසෙයින් වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක ලෙස සේවය කර තිබීම.

- II මැනුම් විද්‍යා නොවන වෙනත් උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියෙකු නම් මැනුම් විද්‍යා උපාධියක් සම්පූර්ණ කිරීම හා ඉන් අනතුරුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස යටත් පිරිසෙයින් වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක ලෙස සේවය කර තිබීම.

5. වෙනත් සුදුසුකම් : (i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii) බඳවා ගැනීම සඳහා සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

6. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

7. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම් ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත් ව සේවයට තෝරා ගනු ලැබේ.

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත තනතුරු සංඛ්‍යාව 01 කි.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

8. සේවා කොන්දේසි :

- සේවය සපයා ගැනීමේ කාලය බඳවා ගැනීමේ දින සිට වසරකි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ඇත.
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස්වරයා සතු වේ.
- තෝරා ගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත් වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදු කළ යුතුය.
- මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
- තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සමග සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.
- **මිනුම් උපකරණ ද එම සේවාව ලබාදෙන පාර්ශවය විසින් සපයාගත යුතුය.**

***සටහන :*** මෙම සේවා සපයා ගැනීම සඳහා අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 පෙබරවාරි මස 27 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත මිනින්දෝරු සේවය ලබා ගැනීම**

01. අයදුම්කරු අයත් වන පළාත් පාලන ආයතනය :.......................................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :.......................................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :.......................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. උපන් දිනය : වර්ෂය :............ මාසය :............... දිනය :.....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ( 2026.03.27 දිනට) වයස : අවුරුදු :............ මාස :......... දින :............

06. ස්ත්‍රී/පුරුෂ භාවය :.........................................................................

07. විවාහක/අවිවාහක භාවය :.........................................................................

08. ස්ථිර ලිපිනය :.........................................................................

09. දුරකථන අංකය :...........................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? :.........................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද ? යන බව :.........................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය
වර්ෂය :..................
විභාග අංකය :..................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (ii) අ.පො.ස. (උසස් පෙළ) විභාගය
වර්ෂය :..................
විභාග අංකය :..................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

12. ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු :.........................................................................................
.........................................................................................

13. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................

14. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත් කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දනිමි.

............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

03-203

# පළාත් පාලන නිවේදන

## තංගල්ල නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 49 වගන්තිය ප්‍රකාරව තංගල්ල නගර සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුල පහත දක්වා ඇති මාර්ගය ආරම්භයේ සිට (නගර සභා කාර්යාලය අසළ සිට) තංගල්ල නගර සභා කාර්යාලය පිටුපස දක්වා කොටසේ රථවාහන ධාවනය සතියේ දිනවල **උදෑසන 8.00 සිට සවස 4.00** දක්වා කාලය තුල මාර්ගයෙහි එක් පසකට පමණක් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් යම් විරුද්ධතාවයක් පලකර සිටින්නේ නම්, එම නිවේදනයේ සිට මාසයක් ඇතුළත ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙන ලදී.

| *පාරේ නම* | *පාරේ දිග* | *පළල* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *ග්‍රාම නිලධාරී වසම* |
|---|---|---|---|---|---|
| මුහුදු මාවත | 641m | 7.3m | මහ වීදිය හන්දිය | වැල්ල බෝධිය අසළ ටී හන්දිය | කොටුවේගොඩ |

ජී. චින්තක කැලුම්,<br>
සභාපති (වැ. බ.),<br>
තංගල්ල නගර සභාව.

2026 පෙබරවාරි මස 20 දින,<br>
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

03-157

---

## තංගල්ල නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 49 වගන්තිය ප්‍රකාරව තංගල්ල නගර සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුල පහත දක්වා ඇති මාර්ගය ආරම්භයේ සිට කඳුරුපොකුණ පාර දක්වා කොටසේ රථ වාහන ධාවනය සතියේ දිනවල **පෙ. ව. 6.30 සිට පෙ. ව. 8.00 දක්වා හා ප. ව. 12.00 සිට ප.ව. 2.00** දක්වා කාලය තුල මාර්ගයෙහි එක් පසකට පමණක් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් යම් විරුද්ධතාවයක් පලකර සිටින්නේ නම්, එම නිවේදනයේ සිට මාසයක් ඇතුළත ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙන ලදී.

| *පාරේ නම* | *පාරේ දිග* | *පළල* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *ග්‍රාම නිලධාරී වසම* |
|---|---|---|---|---|---|
| සැමුවෙල් මාවත | 280m | 9m | මහවෙල පාර | කඳුරුපොකුණ පාර | පල්ලික්කුඩාව නාගරික |

ජී. චින්තක කැලුම්,<br>
සභාපති *(වැ. බ.),*<br>
තංගල්ල නගර සභාව.

2026 පෙබරවාරි මස 20 දින,<br>
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

03-158

**පුත්තලම මහා නගර සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම - සංශෝධිත යෝජනාව

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, පුත්තලම මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති නිශ්චල දේපළවල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපලවල සිදු කළ නව තක්සේරුවට අදාළ වරිපනම් 2026 වර්ෂය සඳහා එකී ආඥාපනතේ 238 (1) උපවගන්තියේ නියමය පරිදි සම්මත කිරීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියෙන් පුත්තලම මහා නගර නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමෙන් -

(අ) හිස් ඉඩම් සහ නේවාසික ස්ථාන මත සියයට තුනක් (03%) ක වරිපනම් බද්දක් ද, සහ

(ආ) වෙළඳ හෝ වානිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට අටක් (08%) ක වරිපනම් බද්දක් ද

2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියේ (2) උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ 2026 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් පුත්තලම මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් යෝජනා කරමි.

**තීරණය**

252 අධිකාරය මහා නගර ආඥාපනතේ 230 වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, පුත්තලම මහා නගර සභාව විසින් 2025.12.30 දින තීරණ අංක 02 යටතේ වරිපනම් බදු කාර්යය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් තීරණ ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ වරිපනම් නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියේ හා 238 වගන්තියේ (1) උපවගන්තියේ නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් බදු මුදල 2026 ජනවාරි මස 31 දින හෝ එදිනට පෙර මහා නගර සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර මහා නගර සභාව ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලෙන් සියයට පහ (5%) ක වට්ටමක්ද ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්මක් ලබා ගැනීමට හැකි වන්නේ අදාළ කාලයට පෙර පැවති හිඟ වරිපනම් වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් තීරණය කරමි.

එම්. එෆ්. රින්ෂාඩ් අහමඩ්,
නගරාධිපති,
පුත්තලම මහා නගර සභාව.

2025 දෙසැම්බර් 30 දින,
පුත්තලම මහා නගර සභා කාර්යාලයේ දී ය.

03-93

# විවිධ දැන්වීම්

## හික්කඩුව නගර සභාව

### 2026 වර්ෂය සඳහා වූ අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ගාස්තු සංශෝධනය

2025.11.28 දිනැති අංක 2465 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරන ලද හික්කඩුව නගර සභාව සඳහා 2026 වර්ෂය වෙනුවෙන් බදු හා බලපත්‍ර පැනවීමේ *ගැසට්* නිවේදනයේ අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත් ගාස්තුව 2026.02.25 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ තීරන අංක 1.3 යටතේ පහත පරිදි 2026.03.01 දින සිට සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

නිතිඥ යසස්වින් ගොඩකන්ද,
සභාපති,
හික්කඩුව නගර සභාව.

**අනතුරුදායක ගස් ඉවත් කිරීම.**

i. අයදුම්පත් හා පරීක්ෂණ ගාස්තු (එක් අයදුම්පතක් සඳහා) - රු. 1,000.00

(***සැ. යු.*** - එක් දේපළක්/භූමියක් වෙනුවෙන් එක් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.)

03-151

---

## තංගල්ල නගර සභාව

### 2026 වර්ෂය සඳහා පරෙයිවැල්ල වෙරළ උද්‍යානය ආශ්‍රිතව ගාස්තු නියම කිරීම

2025.12.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකිරීමට යොමු කළ 2026 වර්ෂය සඳහා පරෙයිවැල්ල වෙරළ උද්‍යානය ආශ්‍රිතව ගාස්තු නියම කිරීම යටතේ රථ වාහන අංගනයට ඇතුළත් කරන වාහනවලට අමතරව, තංගල්ල පරෙයි වැල්ල වෙරළ උද්‍යානය වෙත පැමිණෙන්නන් විසින් තංගල්ල වැල්ල බෝධිය අසල සිට කොටුගොඩැල්ල ක්‍රීඩාංගනය සීමාව දක්වා නතර කරනු ලබන වාහනවලින් ගාස්තු අය කිරීමට 2025.11.20 දින පැවති මාසික සභාවේ තීරණ අංක (ත.න.ස. 2025.11.20 දින මා.ස. 5/II-V) මගින් අනුමත කර තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
තංගල්ල නගර සභාව.

03-156/1

---

## තංගල්ල නගර සභාව

### 2026 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම

තංගල්ල මහජන ක්‍රීඩාංගනය

2025.12.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකිරීමට යොමු කළ 2026 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම යටතේවන උපලේඛනයේ අංක 23 යටතේ ඇති ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ගාස්තු (දිනකට) පහත පරිදි සංශෝධනය කිරීමට 2025.12.18 දින පැවති මාසික සභාවේ තීරණ අංක (ත.න.ස. 2025.11.20 දින මා.ස. 5/III/I) මගින් අනුමත කර තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

| අ.අ. | මහජන ක්‍රීඩාංගනය ලබාදෙන කාර්යය | අය කරන ගාස්තු ප්‍රමාණය (රු.) | තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|
| 01 | ක්‍රීඩා සමාජ/සංවිධාන වෙනත් ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා තරග සඳහා | 30,000.00 | 5,000.00 |
| 02 | සියලුම පාසල් ක්‍රීඩා උත්සව හා ජාතික ක්‍රීඩා උත්සව සඳහා | 15,000.00 | 5,000.00 |
| 03 | අන්තර් සමාජ ක්‍රිකට් තරගාවලි සඳහා | 15,000.00 | 5,000.00 |
| 04 | ප්‍රාථමික පාසල් මගින් පවත්වනු ලබන අවුරුදු උත්සව සඳහා | 10,000.00 | 5,000.00 |
| 05 | දේශපාලන රැස්වීම්/සල්පිල්/සැණකෙළි/සංදර්ශන/ප්‍රදර්ශන/සංගීත ප්‍රසංග/ආගමික උත්සව/අවුරුදු උත්සව (ප්‍රාථමික පාසල් හැර) සඳහා මහජන ක්‍රීඩාංගනය ලබා නොදේ. | - | - |

සභාපති,
තංගල්ල නගර සභාව.

03-156/2

---

**තංගල්ල නගර සභාව**

2026 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම

තංගල්ල නගර ශාලාව වෙන් කිරීමේ ගාස්තු (දිනකට)

2025.12.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකිරීමට යොමු කළ 2026 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම යටතේවන උපලේඛනයේ අංක 18 යටතේ ඇති නගර ශාලාව වෙන් කිරීමේ ගාස්තු (දිනකට) යටතට ගාස්තු අය නොකොට නගර ශාලාව වෙන් කිරීමකදී පරිපාලන වියදම් ලෙස රු. 5.000.00 ක මුදලක් අය කිරීමට 2025.12.18 දින පැවති මාසික සභාවේ තීරණ අංක (ත.න.ස. 2025.12.18 දින මා.ස. 5/III/I) මගින් අනුමත කර තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
තංගල්ල නගර සභාව.

03-156/3

---

සංශෝධනයයි

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**

2025.12.19 දින පළ වූ *ගැසට්* අංක 2468 සහ නිවේදන අංක 12-383 නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

සභාපති/සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව,
සියඹලාණ්ඩුව.

**2026 වර්ෂය සඳහා සතිපොළ බදු ගාස්තු සංශෝධනය**

| *අනු. අංකය* | *සතිපොළ* | *විස්තරය* | *සංශෝධිත මුදල (රු.)* |
|---|---|---|---|
| 01 | පල්ලේවෙල/ඇතිමලේ/සියඹලාණ්ඩුව/ දොඹගහවෙල සතිපොළ 4 සඳහා අදාළ වේ. | දෙහි, මසේඤාක්කා | 120.00 |
| 02 | පල්ලේවෙල සතිපොළ | පල්ලේවෙල සතිපොළ භූමියේ පරණ කඩ කාමරයක් සඳහා | 250.00 |
| 03 | පල්ලේවෙල සතිපොළ | නව ගොඩනැගිල්ලේ කඩ කාමර සඳහා | 350.00 |
| 04 | පල්ලේවෙල/ඇතිමලේ/සියඹලාණ්ඩුව/ දොඹගහවෙල සතිපොළ 4 සඳහා අදාළ වේ. | වර්ග අඩි 15ට නොවැඩි එළවළු හා පළතුරු විකුණන කුඩා ව්‍යාපාරිකයන් සඳහා | 150.00 |
| 05 | දොඹගහවෙල ප්‍රදේශයේ | බල ප්‍රදේශයේ පිටස්තරින් පැමිණෙන වෙළෙඳුන්ට ගාස්තු පැනවීම සම්බන්ධවයි | - |
| 06 | දොඹගහවෙල සතිපොළ | දොඹගහවෙල සිල්ලර පොළ කඩ කාමරයක් සඳහා | 300.00 |
| 07 | දොඹගහවෙල සතිපොළ | දොඹගහවෙල සතිපොළ භූමියේ මාළු ලැල්ලක් සඳහා | 600.00 |
| 08 | ඇතිමලේ සතිපොළ/පල්ලේවෙල සතිපොළ සඳහා | රෙදි පිළි කාමරයක් සඳහා වර්ග අඩි 200 නොවැඩි 100 නොඅඩු | 800.00 |
| 09 | පල්ලේවෙල/ඇතිමලේ/සියඹලාණ්ඩුව/ දොඹගහවෙල සතිපොළ 4 සඳහා අදාළ වේ | මාළු විකිණීම (මෝටර් සයිකල් බයිසිකල් සඳහා) | 600.00 |
| 10 | පල්ලේවෙල/ඇතිමලේ/සියඹලාණ්ඩුව/ දොඹගහවෙල සතිපොළ 4 සඳහා අදාළ වේ. | වාහනයක් පොළට ඇතුල් කර වාහනය මත සිට වෙළඳාම් කිරීම | වර්ග අඩි ප්‍රමාණය බලා ගාස්තු අය කිරීම |
| 11 | සියඹලාණ්ඩුව සතිපොළ | පොළ භූමියේ වේදිකා 04 හි ලොකු කාමරයක් සඳහා | 500.00 |
| 12 | සියඹලාණ්ඩුව සතිපොළ | කුඩා කාමරයක් සඳහා | 400.00 |
| 13 | සියඹලාණ්ඩුව සතිපොළ | මාළු ලැල්ල අසල පරණ කාමර පේලිය | 300.00 |

**2026 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු සංශෝධනය**

*මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා :*

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයකු සඳහා - රු. 12,000.00
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයකු සඳහා රු. 12,000.00

*2026 වර්ෂය අදාළ සේවා ගාස්තු නව ඇතුළත් කිරීම :*

සියඹලාණ්ඩුව සතිපොළ භූමිවල වැසිකිළි භාවිතය සඳහා ගාස්තු අය කිරීම
එක් වරක් සඳහා එක් අයකුගෙන් - රු. 20.00

03-139

## ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව

### 2026 වසර සඳහා ජාතික පාරිසරික සංරක්ෂණ පනත යටතේ කරනු ලබන දැන්වීම

1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම පනතේ 23(අ) වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති විසින් මෙම සභාවට පවරා දී ඇති බලතල අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන මධ්‍යම පාරිසරික අධිකාරිය විසින් සඳහන් කරන ලද කර්මාන්ත සඳහා එම අධිකාරියේ නීති රෙගුලාසිවලට අනුව වසර 03කට වලංගු බලපත්‍රයක් නිකුත් කිරීමටත් ඒ සඳහා වූ ගාස්තු ආයෝජනය කළ මුදලට අනුව පරීක්ෂණ ගාස්තු පහත සඳහන් උපලේඛනය අනුව 2026 වසර සඳහා අයකරන බවත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (1) උපවගන්තිය යටතේ අය කරනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තු සඳහා කිසිදු බලපෑමක් ඇති නොකරන බව 2026.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(01) වසර 03 ක් සඳහා බලපත්‍ර ගාස්තු - රු. 4,500.00

(02) ආයෝජනය කළ මුදල මත ගෙවීම් කළ යුතු විස්තර -

| *අනු. අංකය* | *ආයෝජනය කළ මුදල (රු.)* | *පරීක්ෂණ ගාස්තු (රු.)* |
|---|---|---|
| 01. | 250,000.00 හෝ ඊට අඩු | 3,000.00 |
| 02. | 250,001.00 - 500,000.00 | 3,750.00 |
| 03. | 500,001.00 - 1,000,000.00 | 5,000.00 |
| 04. | 1,000,000.00 ට වැඩි | 10,000.00 |

03-105/1

---

## ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව

### 2026 වසර සඳහා වාහන හා සතුන් මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා එම පනතේ 148 වගන්තියේ 4 උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව 4 උපලේඛනයේ පනවා ඇති පරිදි මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් කර ඇති උපලේඛනය අනුව කිසියම් වාහනයක් හෝ සතෙකු වෙත 2026 වසර සඳහා ගාස්තු නියමකර අය කරන බවත් අදාළ ගාස්තු ගෙවීම් කර බලපත්‍රයක් 2026 මාර්තු මස 31 දිනට පෙර ලබා ගත යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | රු. ශත |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් පාපැදි, කරත්තයක්, ජින් රික්ෂෝවක්,පාපැදියක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| සෑම පාපැදියක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| (අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 0 |
| සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |

ඒ සමග පාපැදියක් සඳහා රුපියල් 16 0 ක් සහ අනෙකුත් ඒවා සඳහා රුපියල් 10 0 ක් අයදුම් පත්‍ර ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ.

මෙම උපලේඛනයේ ''වෙළඳ කාර්යය'' යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

03-105/2

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා සේවා ගාස්තු හා අනෙකුත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ලබා දී ඇති බලතල අනුව මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2026 වසර සඳහා මහජනතාවගේ සේවාවන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව 2026 වසර සඳහා සේවා ගාස්තු සහ අනෙකුත් ගාස්තු නියම කර අය කරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සහතික පත් නිකුත් කිරීම සඳහා පහත සඳහන් ගාස්තු අය කරනු ලැබේ.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| (1) | නොපවරා ගැනීමේ සහතික සඳහා වූ ගාස්තු | 1,000.00 |
| (2) | වීථි රේඛා සහතික සඳහා වූ ගාස්තු | 1,000.00 |
| (3) | නිළධාරි තැන්පතු (වීථි රේඛා සහතික) | 200 0 |
| (4) | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | 1,000 0 |
| (5) | වෙළඳ බලපත්‍ර සහතිකය | 500 0 |

| | | |
|---|---|---|
| | | *රු. ශත* |
| (6) | ඡායා පිටපත් සහතික කිරීම සඳහා වූ ගාස්තු | 100.00 |
| (7) | මහජන පුස්තකාල ගාස්තු - | |
| | (a) පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තුව | 20.00 |
| | (b) පුස්තකාල සාමාජික තැන්පත් මුදල | 200.00 |
| | (c) වාර්ෂික සාමාජිකත්වය අලුත් කිරීම | 50.00 |
| | (d) පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තුව (දිනකට) | 2.00 |
| | (e) වාර්ෂික සාමාජිකත්වය අලුත් කිරීමේ අයදුම්පත | 20.00 |
| | (f) අස්ථානගත වන පොතක් සඳහා පොතේ වටිනාකමින් සතර ගුණයක් අයකරනු ලැබේ. | |
| (8) | ගවයකු ඝාතනය කිරීම සඳහා වූ ගාස්තුව (උත්සව අවස්ථා සඳහා පමණක්) | 1,500.00 |
| (9) | ජල ගාස්තු - 1987/15 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 126(XIII) (ඌ) (ඒ) | |
| | (a) 01 සිට.05 දක්වා ඒකකයක් සඳහා | 50.00 |
| | (b) 06 සිට 10 දක්වා ඒකකයක් සඳහා | 60.00 |
| | (c) 11 සිට 15 දක්වා ඒකකයක් සඳහා | 70.00 |
| | (d) 16 සිට 25 දක්වා ඒකකයක් සඳහා | 75.00 |
| | (e) 26 සිට 35 දක්වා ඒකකයක් සඳහා | 80.00 |
| | (f) 36 සිට වැඩිවන විට ඒකකයක් සඳහා | 100.00 |
| (10) | ශබ්ද විකාශන යන්ත්‍ර ගාස්තු | |
| | (a) දිනකට | 1,000.00 |
| | (b) නැවත ගෙවන තැන්පතු | 2,000.00 |

03-105/3

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාවව**

2026 වසර සඳහා ත්‍රිරෝද රථ ගාල් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122, 126 වගන්තියේ vii(ඌ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව මොරවැව ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් ස්ථාන ත්‍රිරෝද රථ නැවතුම් පොළ වශයෙන් වෙන්කර ඇති බවත් පහත සඳහන් රථ ගාලේ නතර කරන ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් වසරකට රු. 1,000.00 ක් අයකරන බවත් 2026 මාර්තු මස 31 දිනට පෙර ලියාපදිංචි කළ යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**01. ත්‍රිරෝද රථ ගාල පිළිබඳ විස්තර**

01. මොරවැව බෝගහ හන්දිය (A)
02. මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය හන්දිය (B)
03. D 8 හන්දිය (C)

04. නාමල්වත්ත හන්දිය (D)

05. මයිලකුඩාවැව හන්දිය (E)

06. මහදිවුල්වැව හන්දිය (F)

07. මහදිවුල්වැව පාසල හන්දිය (G)

08. රොටවැව ඇතාබැඳිවැව හන්දිය (H)

03-105/4

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා දැන්වීම් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (I) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව 2019.06.04 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී සම්මත කළ 59 අංක දරන තීරණය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර විසින් සම්මත කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 අංක දරන vii(ඊ) උපවගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවන ලද ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර විසින් අනුමත කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2166/18 අංක දරන 2020.03.12 දිනැති *ගැසට්* පත්‍රයේ IV(අ) කොටසේ පළකළ දැන්වීම් අනුව දැන්වීම් ගාස්තු 2026 ජනවාරි මස 01 වැනි දින සිට අය කරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/5

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා නියමිත ස්ථානයක් නොමැතිව ජංගම වෙළඳාමේ නිරතවන ව්‍යාපාරිකයන් සඳහා වූ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) උපවගන්තිය සහ එම පනතේ 126 (x) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව 1998.08.23 දිනැති 520/7 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළකළ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 28 වගන්තිය අනුව මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ජංගම ව්‍යාපාරයේ නිරතවන ව්‍යාපාරිකයන් සඳහා පහත සඳහන් උපලේඛනයට අනුව 2026.01.01 දින සිට ගාස්තු අය කරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *ව්‍යාපාරයේ ස්වභාවය* | *රු. ශත* |
|---|---|---|
| (1) | දිනකට ලොරි මගින් බිත්තර, පොල්, එළවළු, අයිස්ක්‍රීම්, පාන්, කෙසෙල්, ඉරිඟු වැනි ව්‍යාපාරයේ නිරතවන ව්‍යාපාරිකයන් සඳහා | 100.00 |
| (2) | අත් කරත්ත, තල්ලු කරන කරත්ත ආදිය මගින් සෞඛ්‍යයට හිතකර ආහාර පාන විකිණීම සඳහා (වසරකට) | 150.00 |
| (3) | රථ වාහන මගින් කිරි වෙළඳාම් කිරීම සඳහා වසරකට | 500.00 |
| (4) | ව්‍යාපාරික අරමුණ සඳහා ප්‍රවේශවන වාහන ගාස්තු (දිනකට) | 100.00 |

03-105/6

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා 1% බද්ද අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව, මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ස්ථානයක්, හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් ලෙස භාවිතා කරන අවස්ථාවක එය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ අරමුණු සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී අනුමැතිය ලත්,

(1) හෝටලයක්;
(2) ආපනශාලාවක්;
(3) නවාතැනක්.

යනාදිය මගින් පෙරාතුවම වූ අවුරුද්දේ මුළු ආදායමින් 1% ක් ප්‍රාදේශීය සභාවට බදු වශයෙන් ගෙවීම් කළ යුතු බවත් එම මුළු ආදායම් වාර්ථාව ලියාපදිංචි කළ විගණන ආයතනයෙන් සහතික කළ විගණන වාර්ථාව සමග ඉදිරිපත් කළ යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/7

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා ගොඩනැගිලි අනුමැතිය සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 හා 78 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව, 1988.08.23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කළ සම්මත අතුරු ව්‍යවස්ථා 08 වගන්තිය හා අංක 690/3 දරන 1991.11.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය වූ ප්‍රදේශ බවට ප්‍රකාශයට පත්කිරීම අනුව,

ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වසරේ ඉදිකරනු ලබන ගොඩනැගිලි, ඉඩම් අනු බෙදීම්, ඉඩම් ඒකාබද්ධ කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධිත) පනතේ 08 වගන්තිය සමග කියවිය යුතු ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ 21 වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සකස් කළ අංක 2235/54 දරන 2021.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටසේ I ඡේදය (සාමාන්‍ය) යටතේ ප්‍රකාශයට පත්කිරීම අනුව 2026 වසරේ ගාස්තු අයකරන බවත් සියලු ඉදිකිරීම් කටයුතු සඳහා ගොඩනැගිලි අයදුම්පත ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු බවත් එසේ අනුමැතියකින් තොරව ඉදිකරනු ලබන ඉදිකිරීම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බවත් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හෝ සංවර්ධන කටයුතු හෝ අවසන් වූ පසු අනුකූලතා සහතිකය ලබා ගත යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/8

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) (4) වගන්තිය ප්‍රකාරව 2026 වසර සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් එක් සුනඛයෙකු සඳහාම රු. 5.00 ක් අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ. එම අයකිරීම් 2026 මාර්තු මස 31 දිනට පෙර ගෙවීම් කළ යුතු බව මින් දන්වා සිටිමි.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/9

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා අයාලේ ගැවසෙන සතුන් තහනම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වගන්තියේ (1), (2), (3), (4) වැනි අංක දරන උපවගන්ති යටතේ ලබා දී ඇති බලතල අනුව ත්‍රිකුණාමලය මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහා මාර්ගවල, අතුරු මාර්ගවල හා පොදු ස්ථානවල අයාලේ ගැවසෙන එළුවන්, ගවයින් ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කර ඒ සඳහා සකස් කළ පොදු ස්ථාන ආරක්ෂාකර පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි 2026.01.01 දින සිට ගාස්තු අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| (1) | සතෙකු ඇල්ලීම සඳහා වූ ගාස්තු | 1,50.00 |
| (2) | සතෙකු නඩත්තු කිරීමේ ගාස්තු (දිනකට) | 500.00 |
| (3) | පැය 24 ක් තුළ දී නැවත සතාව නිදහස් නොකරන අවස්ථාවේ දී (අතිරේක සෑම දිනයක් සඳහාම) | 500.00 |

එසේ අල්ලා ගන්නා ලද සතුන් සඳහා ඉහත කී ගාස්තු ගෙවා නිදහස් කිරීමට අපොහොසත් වන සතුන් දින 10 කින් අනතුරුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඒ මගින් ලැබෙන මුදල් ප්‍රාදේශීය සභා අරමුදලට බැර කරනු ලැබේ.

03-105/10

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා ගඩොල්, වැලි, බොරළු පස් ප්‍රවාහනය කරන වාහන සඳහා වූ මාර්ග නඩත්තු ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 70 වගන්තියේ (1), (2) උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව මොරවැව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පහත සඳහන් අවශ්‍යතා සඳහා භාවිතා කරන වාහන වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව 2026.01.01 වැනි දින සිට ගාස්තු අය කරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙන ලැබේ.

කේ. ධනුෂ්ක,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,<br>
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| විස්තරය | රු. ශත |
|---|---|
| බොරළු පස් කියුබයක් සඳහා | 50 0 |
| වැලි කියුබයක් සඳහා | 50 0 |
| කළු ගල් කියුබයක් සඳහා | 50 0 |
| බොරළු පස් කැණීමේ දී මාර්ග භාවිතා කිරීම සඳහා තැන්පත් මුදල | 100,000 0 |

බොරළු පස් කියුබ 100ක් ඉක්මවන විටක නැවත අනුමැතිය ලබා ගත යුතුය.

03-105/11

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා සභාව සතු යන්ත්‍ර සූත්‍ර / උපකරණ කුලියට ලබා දීම සඳහා වූ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126(ix)(ආ) උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව පහත සඳහන් අවශ්‍යතාව මත මහජනතාවගේ සේවාවන් ඉටුකිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර/ උපකරණ/ ගොඩනැගිලි කුලියට ලබාදීම/ කසල බැහැර කිරීම යනාදිය සඳහා පහත සඳහන් උපලේඛනය අනුව ගාස්තු 2026.01.01

වැනි දින සිට අය කරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**පාරිසරික සංරක්ෂණය කිරීම සඳහා කුණු කසල බැහැර කිරීම**

| අංක | කියුබයක් සඳහා | ප්‍රාදේශීය සභා වාහන රු. ශත | පෞද්ගලික වාහන රු. ශත |
|---|---|---|---|
| 01. | කර්මාන්ත නොවන | 3,000.00 | 1,500.00 |
| 02. | කර්මාන්ත කටයුතු සඳහා<br>කියුබයකට වඩා වැඩිවන විටක අමතර කියුබයක් සඳහා රු. 1,500.00 බැගින් අය කරනු ලැබේ. | 5,000.00 | 3,000.00 |

**වාහන කුලියට ලබා දීම :**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කාලයෙන් කාලයට දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් තීරණය කරන මිල ගණන් නියමයන්ට අනුව පහත සඳහන් වාහන සඳහා ගාස්තු අය කරනු ලැබේ.

- ➢ බැකෝ ලෝඩර් රථය
- ➢ ට්‍රැක්ටර් සහ ට්‍රේලරය
- ➢ ජල බවුසරය
- ➢ කෘෂ කැබ් රථය
- ➢ ටිපර් රථය

**කුළියට ලබා දීම :**

| විස්තර | රුපියල් | රුපියල් | තැන්පතු මුදල රුපියල් |
|---|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථාන කුලියට ලබා දීම | ව්‍යාපාරික කටයුත්තක් සඳහා (දිනකට) 1,000.00 | ව්‍යාපාරික නොවන කටයුත්තක් සඳහා (දිනකට) - 750.00 | - |

**Road cutting Charge (for Water connection)**

| Nature of Road | Road Site (Rs.) | Road Crossing (Rs.) |
|---|---|---|
| Gravel | 500.00 | 1,000.00 |
| Concrete | 500.00 | 2,000.00 |
| Tar | 500.00 | 2,000.00 |

03-105/12

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා ව්‍යාපාර බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව මෙම පනතේ විධිවිධානය අනුව හෝ එකී පනත යටතේ සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නා වූ හෝ එම පනතේ 150 වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හෝ ඉහත කී පනතේ 152 (1) උප වගන්තිය යටතේ සඳහන් කරන I උපලේඛනයේ සඳහන් යම් වෙළඳ ව්‍යාපාරයක් මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2026 වසරේ පවත්වාගෙන යන ව්‍යාපාරයන් සඳහා එම ව්‍යාපාරයේ 2025 වසර සඳහා වූ ආදායම් අනුව පහතින් සඳහන් II උපලේඛනයේ දක්වා ඇති පරිදි ඇති 2026 මාර්තු මස 31 දිනට පෙර මොරවැව ප්‍රාදේශීය සභාවට ව්‍යාපාර බදු ගෙවීම් කර බලපත්‍ර ලබා ගත යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | |
|---|---|
| (1) | සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම |
| (2) | පාසල් උපකරණ, පොත්පත්, ලිපිද්‍රව්‍ය එක්රැස් කිරීම හා විකිණීම |
| (3) | මත්පැන් හා විදේශීය මත්පැන් අලෙවිය |
| (4) | ඖෂධ විකිණීම (ෆාමසි) |
| (5) | ආයුර්වේද ඖෂධ වර්ග විකිණීම |
| (6) | ඇස් කණ්නාඩි විකිණීම |
| (7) | විද්‍යුත් උපකරණ විකිණීම |
| (8) | ත්‍යාග භාණ්ඩ විකිණීම |
| (9) | සිල්ලර හා තොග වෙළඳාම |
| (10) | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය |
| (11) | ප්ලාස්ටික් හා ඇලුමිනියම් භාණ්ඩ විකිණීම |
| (12) | බටහිර බෙහෙත් ශාලාවක් |
| (13) | කොමිස්කරුවන් |
| (14) | වෙන්දේසිකරුවන්, දැන්වීම්කරුවන් |
| (15) | කොන්ත්‍රාත්කරුවන් |
| (16) | විදේශීය ඒජන්ත මධ්‍යස්ථානයක් |
| (17) | උකස් මධ්‍යස්ථානයක් |
| (18) | පෞද්ගලික අධ්‍යාපන ආයතන |
| (19) | බැංකු හා මූල්‍ය ආයතන |
| (20) | රක්ෂණ සමාගම |
| (21) | කාබනික පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය |
| (22) | පාවහන් අලෙවිය |
| (23) | නිමි ඇඳුම් අලෙවිය |
| (24) | වීඩියෝ පට අලෙවි සැල හා ඡායාරූප ගන්නා ස්ථානය |
| (25) | ටයර්, ටියුබ් නිෂ්පාදනය හා අලෙවිය |
| (26) | සැපයුම්කරුවන් |
| (27) | විදේශ සේවා ආයතනයක් |
| (28) | නීතිඥ සේවා ආයතනයක් |
| (29) | ඉන්ධන ගබඩා කිරීම හා අලෙවිය |
| (30) | තොග වෙළඳාම |
| (31) | වානේ භාණ්ඩ අලෙවිය |
| (32) | පිත්තල කර්මාන්තයක් |
| (33) | ස්වර්ණාභරණ වෙළඳසැල් |
| (34) | පරණ පුවත්පත් එකතු කර අලෙවිය |
| (35) | දේපළ හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති |
| (36) | භාණ්ඩ බෙදාහැරීම |
| (37) | වාහන අලෙවිකරුවන් |
| (38) | සුපිරි වෙළඳසැල් |
| (39) | මැණික් විකිණීම |
| (40) | මෝටර් රථ විකිණීම |
| (41) | යතුරු පැදි අලෙවිය |
| (42) | යතුරු පැදි අමතර කොටස් අලෙවිය |
| (43) | මසුන් ඇති කිරීම හා විකිණීම |
| (44) | රසායනාගාර සේවා, රුධිර සාම්පල් එකතු කිරීම |
| (45) | විවිධ ආයතනවලට කොන්ත්‍රාත් පදනම මත සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම (විදුලි/ජල/ගල්වල) |
| (46) | පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් |
| (47) | කේබල් සම්බන්ධතා සැපයුම් මධ්‍යස්ථානයක් (සන්නිවේදන) |

| | |
|---|---|
| (48) | දැන්වීම් සේවා ආයතනයක් |
| (49) | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම |
| (50) | හම් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම |
| (51) | විදේශීය ගමන් සේවා මධ්‍යස්ථාන |
| (52) | ඉඩම්, නිවෙස් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් |
| (53) | වාහන අලංකාර කිරීමේ ස්ථානයක් (Modification) |
| (54) | රියදුරු පුහුණු පාසලක් |
| (55) | සන්නිවේදන ස්ථානයක් |
| (56) | ග්‍රාමීය බැංකුවක් පවත්වාගෙන යාම |
| (57) | මංගල්‍ය හා අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය හා කුලියට දීම |
| (58) | දුරකථන අලුත්වැඩියාව හා අලෙවිය |
| (59) | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම |
| (60) | ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පී සේවාවන් |
| (61) | ඉන්ධන පිරවුම්හල් |
| (62) | උත්සව භාණ්ඩ කුළියට දීම |
| (63) | විසිතුරු පැළ මධ්‍යස්ථානය |
| (64) | වාහන අලුත්වැඩියාව හා අලෙවිය |
| (65) | කුෂන් වැඩපළක් |
| (66) | රථවාහන සඳහා අමතර කොටස් විකිණීම |
| (67) | යකඩ එකතු කිරීමේ හා අලෙවි කිරීම |
| (68) | ගුවන් විදුලි, රූපවාහිනී සඳහා අමතර කොටස් විකිණීම |
| (69) | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී හා මහන මැෂින් විකිණුම් ස්ථානයක් |
| (70) | ත්‍රීරෝද රථ අමතර කොටස් විකිණීම |
| (71) | වෛද්‍ය සේවා ස්ථානයක් |
| (72) | රථ වාහන සඳහා දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් |
| (73) | මෙට්ට නිෂ්පාදන මධ්‍යස්ථානයක් |
| (74) | පුවත්පත් විකිණීම හා බෙදා හැරීමේ ස්ථානයක් |
| (75) | ඔරලෝසු විකුණුම් ස්ථානයක් |
| (76) | විසිතුරු භාණ්ඩ විකිණීම |
| (77) | යකඩ බට විකිණීම |
| (78) | ඇඹරුම් හලක් පවත්වාගෙන යාම |
| (79) | කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය හා විකිණීම |
| (80) | බාල්දි හා භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම |
| (81) | සන්නිවේදන භාණ්ඩ විකුණුම් ස්ථානයක් |
| (82) | ධීවර ඔරු තබා ගැනීම |
| (83) | සංචාරක ප්‍රදේශවල බෝට්ටු සේවා |
| (84) | යාන්ත්‍රික ධීවර ඔරු විකිණීම |

| | |
|---|---|
| (85) | ඉස්සන් ඇති කිරීමේ ගොවි පොළක් කිරීම |
| (86) | මාළු වාඩි පවත්වාගෙන යාම |
| (87) | වී, සහල් සහ පොහොර තොග වෙළඳාම |
| (88) | සැහැල්ලු බීම වර්ග තොග වෙළඳාම |
| (89) | අයිස් වාඩියක් පවත්වාගෙන යාම |
| (90) | ගඩොල් නිෂ්පාදනය හා අලෙවිය |
| (91) | උළු නිෂ්පාදනය හා විකිණීම |
| (92) | කොන්ක්‍රීට් භාණ්ඩ හා බ්ලොක් ගල් නිෂ්පාදනය හා අලෙවිය |
| (93) | රෙදි කඩයක් පවත්වාගෙන යාම |
| (94) | පානීය ජලය නිෂ්පාදනය හා විකිණීම |
| (95) | ලුණු ලේවායන් පවත්වාගෙන යාම |
| (96) | කොප්පරා නිෂ්පාදනය හා අලෙවිය |
| (97) | පපඩම් නිෂ්පාදනය හා විකිණීම |
| (98) | තල් හකුරු නිෂ්පාදනය හා විකිණීම |
| (99) | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම |
| (100) | ගල් වලක් පවත්වාගෙන යාම |
| (101) | කේබල් පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් (රූපවාහිනී) |
| (102) | ආනයන හා අපනයන භාණ්ඩ මධ්‍යස්ථානයක් |
| (103) | පෞද්ගලික පෙර පාසල් |
| (104) | භාණ්ඩ හා සේවා සපයන ස්ථානයක් |
| (105) | රා රැස්කිරීම හා විකිණීම |
| (106) | වාහන සෝදන ස්ථානයක් පවත්වාගෙන යාම |
| (107) | දෛනික පදනම මත කුලියට ලබාදෙන නිකේත |
| (108) | අයිස් ක්‍රීම් හා සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය |
| (109) | කුකුල් ගොවිපොළක් පවත්වාගෙන යාම |
| (110) | සිප්පි කටු හා බෙල්ලන් රැස්කිරීම හා විකිණීම |
| (111) | හඳුන්කූරු නිෂ්පාදනය හා විකිණීම |
| (112) | අසමෝදගම් නිෂ්පාදනය හා විකිණීම |
| (113) | ගවයින්, එළුවන් හා කුකුළන් විකිණීම |
| (114) | සූර්ය බල ශක්තිය භාවිතයෙන් විදුලිය සැපයුම් මධ්‍යස්ථානයක් |
| (115) | සංචාරක ප්‍රදේශ ආශ්‍රිතව ජංගම රස කැවිලි ව්‍යාපාරයේ නිරතවීම |
| (116) | මෝටර් රථ සඳහා Body සවිකරන ස්ථානයක් |
| (117) | තේ කොළ ව්‍යාපාරය |
| (118) | ටයර් නැවත පිරවීමේ ස්ථානයක් (Refil) |
| (119) | කායික ශක්තිය වර්ධන කේන්ද්‍ර ස්ථානය |
| (120) | මුද්‍රණාලයක් |

**උපලේඛනය II**

| *I තීරුව* | *II තීරුව* |
|---|---|
| *ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්* | *ගෙවිය යුතු වාර්ෂික බදු මුදල රු. ශත* |
| රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6,000.00 ඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| රු. 12,000.00 ඉක්මවන එහෙත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| රු. 18,750.00 ඉක්මවන එහෙත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| රු. 75,000.00 ඉක්මවන එහෙත් රු. 150,000.00 නොඉක්මවන අවස්ථාවක | 1,200.00 |
| රු. 150,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

තවද, ඉහතින් සඳහන් සියළුම ව්‍යාපාර සම්බන්ධව පෙර වර්ෂයේ සම්පූර්ණ ආදායම පිළිබඳ විස්තර අදාළ එම ආයතනයේ කළමණාකරු, අයිතිකරු, ගණකාධිකාරී හෝ වෙනත් බලයලත් කවර හෝ නිළධාරියකු විසින් වාර්ෂිකව මොරවැව ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව මින් දැනුම් දෙනු ලැබේ.

03-105/13

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා ව්‍යාපාර බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනයේ I තීරයේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් 2026 වසරේ පවත්වන්නේ නම් II වැනි තීරයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු නියම කර අයකරන බවත් එකී අයකිරීම් 2026 මාර්තු මස 31 දිනට පෙර ගෙවීම් කර බලපත්‍ර ගත යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංක* | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | *ව්‍යාපාරය හෝ රැකියාව* | *වෙළෙඳ කටයුතු කරනු ලබන දේපළෙහි (වාර්ෂික වටිනාකම)* | | |
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 751 සිට රු. 1,500.00 දක්වා රු. ශත* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 01. | බීඩි සුරුට්ටු විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 02. | බොරළු හෝ කළුගල් කඩන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 03. | ගල් ක්‍රසරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04. | ගඩොල්, උළු ගබඩා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 05. | මැටි භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 06. | වාහන කුළියට ලබාදීම | | | |
| 07. | පරණ යකඩ භාණ්ඩ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |

| | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංක* | *ව්‍යාපාරය හෝ රැකියාව* | *වෙළෙඳ කටයුතු කරනු ලබන දේපළෙහි (වාර්ෂික වටිනාකම)* | | |
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 751 සිට රු. 1,500.00 දක්වා රු. ශත* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 08. | සිමෙන්ති විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 09. | තෙල් ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000 |
| 11. | ගෘහ භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 12. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13. | ආභරණ වැඩපොළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | ආභරණ රන් වතුරේ දමන ස්ථානයක් තබා ගැනීම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | තීන්ත, වානිස්, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16. | පිඳුරු කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17. | බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් | 500.00 | 750.00 | 1,000.00 |
| 18. | හිස් බෝතල් රැස් කරන ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 19. | පාපැදි හා යතුරු පැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 20. | පාපැදි හා යතුරු පැදි අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 21. | ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 22. | ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 23. | ශීතකරණ හා අධිශීතකරණ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 24. | විදුලි උපකරණ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 25. | ජලපොම්ප විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 26. | වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 27. | භූමිතෙල් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 28. | අතින් හෝ විදුලිබලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 29. | අවමංගල්‍ය උත්සව භාණ්ඩ සැපයීම | 500.00 | 750.00 | 1,000.00 |
| 30. | ඇඳුම් බතික් දමන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 31. | හුණු හෝ හුණුගල් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 32. | වී ඇඹරුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 33. | ගීත හා සංගීත පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 34. | රූපවාහිනී, සිනමා කැසට් පට විකිණීම හා කුලියට ලබා දීම | 500.00 | 750.00 | 1,000.00 |
| 35. | ඡායා පිටපත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 36. | ඡායා රූප මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (ජංගම) | 500.00 | 750.00 | 1,000.00 |
| 37. | ධීවර යන්ත්‍රෝපකරණ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 38. | ධීවර යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | *I* වන තීරුව | *II* වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංක | ව්‍යාපාරය හෝ රැකියාව | වෙළෙඳ කටයුතු කරනු ලබන දේපළෙහි (වාර්ෂික වටිනාකම) | | |
| | | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 751 සිට රු. 1,500.00 දක්වා රු. ශත | රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 39. | ධීවර යන්ත්‍ර පැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 40. | ධීවර ඔරු තබා ගැනීම | 500.00 | 750.00 | 1,000.00 |
| 41. | සංචාරක බෝට්ටු සේවා පවත්වාගෙන යාම (පෞද්ගලික) | 500.00 | 750.00 | 1,000.00 |
| 42. | දුම්කොළ පදම් කිරීම හා වියලීම | 500.00 | 750.00 | 1,000.00 |
| 43. | ගල් කැඩීම (අතින්) | 500.00 | 750.00 | 1,000.00 |
| 44. | මී හරක් හා එළහරක් ගොවිපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 45. | ගෑස් පිරවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 46. | සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 47. | ගෑස් සිලින්ඩර් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 48. | ක්‍රීඩා භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 49. | ඇලුමිනියම් සවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 50. | විසිතුරු භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 51. | ස්ප්‍රේ පෙයින්ටින් සහ ලේත් වැඩපොළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 52. | දුරකථන විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 53. | මැහුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 54. | සිප්පි සහ බෙල්ලන් රැස්කිරීම හා විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 55. | බීජ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 56. | ගෘහ භාණ්ඩ විකිණීම (ජංගම) | 500.00 | 750.00 | 1,000.00 |
| 57. | ටයිල් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 58 | මුරුක්කු විකිණීම (ජංගම) | 500.00 | 750.00 | 1,000.00 |
| 59. | ඉන්ධන විකිණීම (කුඩා ප්‍රමාණය) | 500.00 | 750.00 | 1,000.00 |
| 60. | යතුරු ලියන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 61. | ඇලුමිනියම් භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 62. | කළුගල් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 63. | විදුලි සම්බන්ධතා භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 64. | කුළු බඩු ඇසුරුම් කර විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 65. | රූප රාමු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 66. | ලිහිසි තෙල් විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 67. | ගඩොල් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 68. | උළු විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 69. | ටකරම් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |

## ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව

### 2026 වසර සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වගන්තියේ (1) (ආ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනයේ I තීරයේ සඳහන් යම්කිසි ව්‍යාපාරයක් 2026 වසරේ පවත්වනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම II තීරයේ සඳහන් පරිදි සීමාව තුළ ක්‍රියාත්මක වන්නේ නම් එම උපලේඛනයේ සඳහන් කර ඇති බලපත්‍ර ගාස්තු අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ඒ සමගම 2026 මාර්තු මස 31 දිනට පෙර ව්‍යාපාරය පවත්වාගෙන යන ව්‍යාපාරිකයින් මොරවැව ප්‍රාදේශීය සභාවට අදාළ ගාස්තු ගෙවා බලපත්‍ර ලබාගත යුතු බව මින් දන්වා සිටිනු ලැබේ.

කේ. ධනුෂ්ක,  
සභාපති,  
ප්‍රාදේශීය සභාව,  
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,  
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | | *වෙළෙඳ කටයුතු කරනු ලබන දේපළෙහි (වාර්ෂික වටිනාකම)* | | |
| *අනු. අංක* | *ව්‍යාපාරය හෝ රැකියාව* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 751.00 සිට රු. 1,500.00 දක්වා රු. ශත* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 03. | තේ කඩයක් හා හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04. | නේවාසික පහසුකම් සමග නිකේතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 05. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06. | බේකරියක් පවත්වාගෙන යාම | | | |
| 07. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08. | ගිමන් හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | ආහාර වර්ග විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | හෝටලයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12. | රස මුසුකළ පාන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13. | ඇසුරුම් පෙට්ටියකට වඩා රස මුසුකළ පාන නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | අයිස් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | සිසිල් බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16. | පැණි රසැති කෑම වර්ග විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |

| අනු. අංක | I වන තීරුව | II වන තීරුව | | |
|---|---|---|---|---|
| | | වෙළෙඳ කටයුතු කරනු ලබන දේපළෙහි (වාර්ෂික වටිනාකම) | | |
| | ව්‍යාපාරය හෝ ක්‍රියාව | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 751.00 සිට රු. 1,500.00 දක්වා රු. ශත | රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 17. | පළතුරු විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| `18. | එළවළු කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 19. | එළහරක් පට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 20. | කිරි රැස්කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 21. | පොල්තෙල් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 22. | තේ කොළ ඇසුරුම් කර විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 23. | සිල්ලර හා තොග වෙළඳාම | 500.00 | 750.00 | 1,000.00 |
| 24. | සහල් තොග වෙළඳාම | 500.00 | 750.00 | 1,000.00 |
| 25. | ධාන්‍ය වර්ග විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 26. | තේ කොළ හා කුළු බඩු ඇසුරුම් කර විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 27. | පදම් කළ මාළු හෝ කරවල විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 28. | ආහාර හෝ පළතුරු බඳුන්වල බහලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 29. | සුරතල් සතුන්ගේ ආහාර විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 30. | සුරතල් සතුන් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 31. | වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 32. | පොල්තෙල් හිඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 33. | ශබ්ද විකාශන සේවා සැපයීම | 500.00 | 750.00 | 1,000.00 |
| 34. | ක්‍රීඩා භාණ්ඩ විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 35. | කඩල, මුරුක්කු විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 36. | ජංගම රස කැවිලි විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 37. | සුප් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 38. | ඌරු කොටු පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 39. | මුදවපු කිරි හා මී කිරි විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 40. | ලී මඩුවක් හෝ විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 41. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 42. | හාඩ්වෙයාර් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 43. | කුඩා පෙට්ටි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 44. | අත් යන්ත්‍ර හෝ යාන්ත්‍රික ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 45. | බෝතල් කළ පානීය ජලය විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 46. | වැඩපොළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | | *වෙළෙඳ කටයුතු කරනු ලබන දේපළෙහි (වාර්ෂික වටිනාකම)* | | |
| *අනු. අංක* | *ව්‍යාපාරය හෝ රැකියාව* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 751.00 සිට රු. 1,500.00 දක්වා රු. ශත* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 47. | බිම්මල් විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 48. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 49. | කොප්පරා විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 50. | කෙටි ආහාර විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 51. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

03-105/15

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා රථවාහන නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 68 වගන්තියෙන් හා 126 VII (ඇ) උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල අනුව මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සභාවට අයත් රථගාල් තුළ සභාවේ ලියාපදිංචි කර ඇති ත්‍රිරෝද රථ හැර අනෙකුත් රථ වාහන සඳහා පහත සඳහන් උපලේඛනය අනුව රථගාල් ගාස්තු නියම කර අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *වාහන විස්තර* | *බලපත්‍ර සඳහා ගාස්තු* | |
|---|---|---|---|
| | | *මාසිකව රු. ශත* | *වාර්ෂිකව රු. ශත* |
| 01. | සභා අනුමැතිය නොලත් ත්‍රිරෝද රථයක් සඳහා | 300.00 | 3,600.00 |
| 02. | සභා අනුමැතිය ලත් ත්‍රිරෝද රථ හැර අනෙකුත් වාහන සඳහා දිනකට<br>වෑන්, කාර්, ජීප් රථ, මෝටර් වාහන | | 50.00 |
| 03. | අනෙකුත් මෝටර් වාහන | | 75.00 |
| 04. | යතුරු පැදි | | නොමිලේ |

03-105/16

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා ග්‍රැමෆෝන්, ශබ්දවාහිනී යන්ත්‍ර යනාදිය ක්‍රියාකරවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 (ix) (ඊ) උපවගන්තිය යටතේ ලබා දී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දිනැති 520/7 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ ගරු පළාත් පාලන අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කළ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 13 වගන්තිය අනුව මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ග්‍රැමෆෝන්, ශබ්දවාහිනී යන්ත්‍ර, ස්වයංක්‍රීය හෝ ශබ්ද නිපදවන හෝ ප්‍රතිරාවය ඇතිකරන කිසියම් උපකරණයක් ක්‍රියාකරවීමෙන් හෝ ක්‍රියාකරවීමට සැලැස්වීමෙන් හෝ ක්‍රියාකරවීමට වෙනත් තැනැත්තෙකුට ඉඩදීමෙන් එම ශබ්දය අධිකවීම හේතුවෙන් හෝ ප්‍රතිරාවය නිසා හෝ එහි අඛණ්ඩව ක්‍රියාකිරීම හේතුකොට ගෙන අසල්වාසීන්ට පීඩාකාරී ඇතිවන්නේ නම් එය මහහරවා ගත යුතු බවත් එසේ ක්‍රියාකිරීමට සැලසුම් කරන්නේ නම් ඒ සඳහා බලපත්‍ර ගාස්තු වශයෙන් දිනකට රු. 1,000.00 ක් 2026 වර්ෂය සඳහා අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයන්ට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/17

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණයයි සැලකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළහැකි වන අවස්ථාවක -

1. ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ; හෝ
2. සැබැවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය, ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මඟින් දරන්නාවූ; හෝ
3. ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ අවස්ථාවක,

මොරවැව ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඒ ඉඩමේ අයිතිකරුගෙන් අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයන්ට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/18

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබාදී ඇති බලතල ප්‍රකාර මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම

විකිණීමෙන් ලත් මුදලින් 1% බද්දක් මොරවැව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/19

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා විනෝද බදු ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත අනුව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව සහ (267 අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 02(I) උපවගන්තිය යටතේ 1947 වසරේ ජූලි මස 26 දිනැති හා අංක 9672 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකළ දැන්වීම් අනුව මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඉහත සඳහන් ආඥාපනතේ සඳහන් යම්කිසි විනෝදවීම වෙනුවෙන් නැරඹීම සඳහා ප්‍රවේශවන අවස්ථාවේදී ගෙවීම් කරනු ලබන ගාස්තුවෙන් 25% ට සමාන බද්දක් නියම කර අයකරන බවත්, තවද, ඉහත සඳහන් 8(1) වගන්තිය ප්‍රකාරව විනෝද බද්දෙන් නිදහස් කරන බවත් (176 අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම ආඥාපනතේ 03 වගන්තිය ප්‍රකාරව ගාස්තු නියම කර අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-105/20

---

**ත්‍රිකුණාමලය, මොරවැව ප්‍රාදේශීය සභාව**

2026 වසර සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙම පනතේ 135 වගන්තිය ප්‍රකාරව බිම් බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, බිම් බද්දට යටත් ඉඩම් සඳහා ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද සෑම හෙක්ටයාර් ඉඩම් මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් පනවා අයකරන බව 2025.09.26 දිනැති අංක 36 දරන තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

කේ. ධනුෂ්ක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොරවැව, ත්‍රිකුණාමලය.

2025 දෙසැම්බර් මස 26 දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *ඉඩම් ප්‍රමාණය* | *අයබදු වර්ෂයකට (රු.)* |
|---|---|
| ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩුවන අවස්ථාවක | 50.00 |
| ඒ ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වන අවස්ථාවක | 10.00 |

03-105/21

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.